**ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව**
**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
**------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4. මූල්‍යප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1. මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම**

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ - 02 සටහනෙහි, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශයෙහි මුළු පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්වල එකතුව රු.7,059,436,265 ක් වුවද වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයෙහි (ඒ.සී.ඒ.**(2)(i)**) මුළු පුනරාවර්ථන හා මූලධන වියදම් එකතුව රු.7,029,710,753 ක් වීමෙන් රු.29,725,512 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඒසීඒ - 02 සටහනට දිගුවක් ලෙස ඒ.සී.ඒ 2(**ii**) සටහන නිරීක්ෂණය කිරීමේදී මෙම තත්වය නිරාකරණය කරගත හැකි බව විගණනය වෙත පෙන්වා දෙමි. | විධිවිධාන ප්‍රකාරව ඒ.සී.ඒ 2(**i**) වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය මුළු වියදමට සමාන අයුරින් සකස් විය යුතු වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.179,311,886 ක මූල්‍ය නොවන වත්කම් හා වාරියපොල හා යාපනය බන්ධනාගාර සතු වටිනාකම හඳුනා නොගත් ස්ථාවර වත්කම්, මූල්‍ය නොවන ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේ මිලදී ගැනීම් හා අපහරණ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ගැලපීමට නොහැකි වූ අතර 2021 වර්ෂයේ සිට විසර්ජන ගිණුම මගින් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි නියමිත පරිදි මිලදී ගැනීම හා අපහරණ ගැලපීම් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව විගණනය වෙත දැනුම් දෙමි. | විධිවිධාන ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතු වේ. |

**1.6.2. විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති රු.47,325,414 ක ජංගම වත්කම් හා රු.197,540 ක ජංගම වගකීම් තහවුරු කර ගැනීමට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | ණයහිමි හා උපචිත වියදම් වලට අදාල වට්නාකම් සකස් වී ඇති ආකාරය අවසන් ගිණුමේ උපලේඛණ අංක 03 මඟින් දක්වා ඇති අතර ණයහිමි ශේෂ සනාථ කිරීමේ ලිපි මේ සමඟ ඉදිරිපත් කරමි. ණයගැති උපලේඛණ විගණනය වෙත ඉදිරිපත් කළ හැකි බව විගණනය වෙත දන්වා සිටිමි. | අවශ්‍ය සියලු සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |

**1.6.3 බැදීම් හා බැරකම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව රු.218,991,989 ක බැදීම හා බැරකම් භාණ්ඩාගාර පොත් අනුව රු.468,863,169 ක් වූයෙන් රු.249,871,180 ක වෙනසක් විය. | බැදීම් ඇතිකර ගන්නා අංශ කිහිපයක් එක් ආයතනයක ඇතත් ඔවුන් සියල්ලන්ටම සිගාස් පද්ධතියට පිවිස බැරකම් පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීමට ඇති ප්‍රායෝගික ගැටළුකාරි තත්වයන් මෙම ශේෂ අතර වූ වෙනසට හේතු සාධක වේ. | මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් භාණ්ඩාගාරයේ සටහන්වල බැදීම් හා බැරකම් සමඟ සැසදි තිබිය යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇවන්ගාර්ඩ් මැන් පවර් රෙක්රුටින් පුද්ගලික සමාගම සමඟ ක්‍රියාත්මක ව්‍යාපෘතිය සඳහා සිරකරුවන්ගේ ශ්‍රමය සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මාස 02 ක් සඳහා ලැබිය යුතු රු.3,707,000 ක් 2021 අප්‍රේල් 01 වන දින වන විටත් ලැබී නොතිබුණි. එසේම 2021 ජුනි මාසය සඳහා ලැබුණු රු.655,000 කින් සියයට 10 ක් රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි 128(1)(ආ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. රාජ්‍ය ආදායමට බැරවිය යුතු ප්‍රමාණයන් නිවැරදිව හඳුනාගෙන රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වේ. |

**2.2. වියදම් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්ථන වැය විෂයයන් 12 ක ඉතිරිවීම් සියයට 10 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. | පුනරාවර්ත වැය විෂයයන් 12 ක් සඳහා සලසා ගෙන තිබූ රු. 997,425,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වලින් වැය විෂයන්හි ඉතිරිවීම් සියයට 10 සිට 100 දක්වා වූ පරාසයක පැවති බවට විගණනය විසින් කර ඇති නිරීක්ෂණ හා එකඟ වෙමි. මෙම තත්වය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම, කොවිඩ් වෛරස තත්වය හේතුවෙන් ප්‍රතිපාදන වැය කිරීමට නොහැකි වීම මෙන්ම සංවරණ සීමාවන් හේතුකොටගෙන පුනරාවර්තන වැය විෂයන්හි ප්‍රතිපාදන ඌණ උපයෝජිතව ඉතිරි විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. |
| (ආ) | මූලධන වැය විෂයයන් 10 ක ඉතිරිවීම් සියයට 18 සිට සියයට 89 ක් දක්වා වූ පරාසයක පැවතුණි. | මෙම තත්වය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම, කොවිඩ් වෛරස තත්වය හේතුවෙන් නියමිත පරිදි ක්‍රියාත්මක වැඩ අවසන් කිරීමට නොහැකි වීම මෙන්ම යම් යම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රට තුල පැවති තත්වය පාලනය කල නොහැකි වීම වැනි හේතු සාධක වේ. එම නිසා මෙම වැය විෂයන්හි ප්‍රතිපාදන අපේක්ෂිත ආකාරයෙන් උපයෝජනය කිරීමට නොහැකි විය. | -එම- |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ඉක්ම වූ රු.7,424,112 ක හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. | වසර ගණනක සිට අත්තිකාරම් බී ගිණුමට අදාලව හිඟ ණය ශේෂයන් පවති. විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය විශ්‍රාම පාරිතෝෂිතය මඟින් අයකර ගන්නා අතර සමහරක් නිලධාරීන් මියගොස් හා විදේශගත වී ඇති බැවින් | හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | ණය වර්ග අයකර ගැනීමේ දී ගැටළු මතුවේ. අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදයේ උපදෙස් අනුව රු.25,000 කට අඩු ණය ශේෂ කපා හැරීම සඳහා රු.242,220 ක මුදලක් 2020 නොවැම්බර් 28 දින බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යවා ඇත. | |
| (ආ) | ආයතන සංග්‍රහයේ **xxiv** වැනි පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදයට පටහැනිව කටයුතුකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට මාරු වී ගිය නිලධාරීන් 40 දෙනෙකුගේ අයවිය යුතු ණය ශේෂ රු.437,913 ක් විය. | ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.91,209 ක ශේෂයෙන් බොහෝ ශේෂයන් ඉතා පැරණි 2000 වර්ෂයට පෙර ශේෂයක් වීම නිසා එම ස්ථානමාරු වී ගිය තොරතුරු සොයා ගැනීමට අපහසු වීම මත ණය අයකර ගැනීම ප්‍රමාද වී ඇත. අවු. 1 ත්, අවු.2 ත් අතර අයවීමට තිබූ රු.232,136 ක ණය ශේෂය නිරවුල් කර ඇති අතර මාස 3 ත්, 12ත් අතර රු.114,568 ක ණය ශේෂය නිරවුල් කරන ලෙස අදාල ආයතනය වෙත දැනුම් දී ඇත. | හිඟහිටි ශේෂ අයකර ගැනීමට පියවරගත යුතු වේ. |
| (ඇ) | 2017 දෙසැම්බර් 29 දිනැති හා අංක 262/2017 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4 හා 6 ඡේදවලට පටහැනිව කටයුතු කිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ දෙපාර්තමේන්තු **'බී'** ගිණුමේ විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ ලෙස රු.1,783,542 ක් දක්වා තිබුණි. | අවු.5 කට වඩා පැරණි ණය ශේෂයන්වල තොරතුරු බොහොමයක් සොයාගත නොහැකි වී ඇත. මෙම ණය ශේෂ අතුරින් රු.25,000 වඩා අඩු ණය ශේෂ කපා හැරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශයට යවා ඇත. වසර 1 ත්, වසර 4 ත් අතර වූ විශ්‍රාම ගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. විනය පරික්ෂණ හා අධිකරණ ක්‍රියාමාර්ග අවසන් නොවූ නිලධාරීන්ගේණය ශේෂ අයකර ගත නොහැකි වී ඇත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ඈ) | නිලධාරීන් 06 දෙනෙකුගේ හඳුනානොගත් ණය ශේෂවල එකතුව රු.415,546 ක් විය. | රු.401,152 ක ණය ශේෂයන් හඳුනා ගැනීම අපහසු වී ඇති අතර එකිනෙක බන්ධනාගාර අතර විටින් විට ස්ථාන මාරු කිරීමේ දී රු.14,393 ක ශේෂයක් ගිණුම් පොත්වලට ඇතුළත් නොවීම නිසා ස්ථාන මාරු වී පැමිණි හා ස්ථාන මාරු වී ගිය නිලධාරීගේ ශේෂ අතර වෙනසක් පැවතුණි. | හඳුනා නොගත් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

2.4 **තැන්පතු**

----------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| ---------------------- | | --------------------------- | ----------- |
| (අ) | තැන්පත් ගිණුම් 03 ක වර්ෂ 02 ක් ඉක්මවූ රු.1,008,120 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කරන ලෙස බන්ධනාගාර අධිකාරිවරුන්ට උපදෙස් ලබා දීමට කටයුතු කර ඇති බව විගණනය වෙත දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සිරකරුවන්ගේ පුද්ගලික ගිණුම්වලට බැර කළ යුතු රු.4,554,557 ක ශේෂයක් තැන්පතු ගිණුමේ පැවතුන අතර ඉන් වර්ෂ 02 ක ඉක්මවූ ශේෂය රු.1,394,779 ක් විය. | විගණන නිරීක්ෂණ අනුව දක්වා ඇති සිර වේතන ගිණුමේ වසර 02 කට අධික කාලයක් පවතින රු.1,394,779 ක ශේෂය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 22/2011 අනුව වසරකට නොඅඩු කාලයකදී හිමිකම්පානු නොලැබූ සිර වේතන සිරකරු සුබසාධක අරමුදලට බැර කිරීමට කටයුතු කරන ලෙස බන්ධනාගාර අධිකාරිවරුන්ට උපදෙස් ලබා දී ඇත. | -එම- |

2.5 **අග්‍රිම ශේෂය**

---------------

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ---------------------------------- | ----------- |
| සමාලෝචිත වර්ෂය අවසානයට නොපිය වූ උප අග්‍රිම ශේෂය රු.54,000 ක් විය. | 2021 අප්‍රේල් මස ගිණුම් සාරාංශය මඟින් නිරවුල් කිරීමට කටයුතු කරන බව විගණනය වෙත දන්වා සිටිමි. | නොපිය වූ උප අග්‍රිම පියවීමට කටයුතු කළ යුතුය. |

**2.6** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 115 පටහැනිව අවස්ථා 2,373 කින් රු.629,797,555 ක බැරකම් හා බැදීමේවලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 115 ප්‍රකාරව වර්ෂය තුල ඉදිරිපත් කෙරෙන හිමිකම් පෑම් හැකිතාක් දුරට එම වර්ෂය තුල නිරවුල් කිරීමට අවශ්‍ය හැකිතාක් දුරට අඩු කිරිමට හා නිරවුල් කිරිම ගත හැකි උපරිම ක්‍රියා මාර්ග ගෙන ඇති බව සඳහන් කරමි. එසේම පසුගිය සමය තුල රට තුල පැවති හදිසි තත්වයන් හේතුවෙන් නියමිත පරිදි අක් මුදල් නොලැබීම ද මෙපමන ප්‍රමාණයක් රැස් විමට සෘජුව හා වක්‍රව හේතු සාධක වි ඇති බවත් විගණනය වෙත පෙන්වා දෙමි. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

**2.7** **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2.8** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | නිරීක්ෂණය<br>---------------<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රාහයේ මුදල් රෙගුලාසි 502(ආ)(i) | වසර 20 කට වඩා පැරණි රාජ්‍ය අංශයෙන් හා පෞද්ගලික අංශයේ විකුණුම් වෙනුවෙන් පිළිවෙලින් ලැබිය යුතු රු.1,481,622.18 ක් හා රු.17,461 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ ණය අයකර ගැනීමට පත්කල කමිටුව මගින් නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතින බව විගණනය වෙත දැනුම් දෙමි. තවද 2015 වර්ෂයට පෙර වූ රාජ්‍ය අංශයෙන් සහ පෞද්ගලික අංශයෙන් ලැබිය යුතු හිඟ බිල්පත් සම්බන්ධයෙන් වූ ලේඛණ නොමැති වීම සහ පැරණි බිල්පත් අස්ථානගත වී තිබීම යන හේතු මත නිරවුල් කිරීම ප්‍රමාද වීමට හේතු වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලැබිය යුතු මුදල් අයකර ගත යුතු වේ. |
| (ආ) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 05/2016 හා 2016 මාර්තු 31 දිනැති චක්‍රලේඛයේ 3.2.6 වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කොරොනා වසංගත තත්ත්වය මත වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1. ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| <u>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය</u> | | |
| (අ) 4(2) මාර්ගෝපදේශය ප්‍රකාරව අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ කෙරෙහි විශේෂ අවධානය යොමු කර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 4(2) වගන්තිය ප්‍රකාරව වසර 03 ක කාලයක් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කිරීම සඳහා සටහන් කරගත් බව විගණනය වෙත දැනුම් දෙමි. | |
| (ආ) | 2.7.7 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රසම්පාදනයන් සිදු නොකර මහර බන්ධනාගාරයේ 2019, 2020 හා 2021 වර්ෂවල රු.2,635,639 ක් වටිනා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම් ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැරව හදිසි අවශ්‍යතාවන් ලෙස මිලදී ගෙන තිබුණි. | විගණනය විසින් මහර බන්ධනාගාරයේ සිදු කරන ලද පරීක්ෂණයට අදාළ විගණන විමසුම සඳහා පැහැදිලි කිරීම මහර බන්ධනාගාරය වෙතින් පිළිතුරු කැඳවා ඇති අතර මීට අදාළ විස්තරාත්මක පිළිතුරක් ඒ සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවන පරිදි මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුගතව ක්‍රියා කරන ලෙසට අදාළ බන්ධනාගාර අධිකාරි වෙත උපදෙස් ලබා දී ඇති බවත් විගණනය වෙත දැනුම් දෙමි. | -එම- |

## 3.2. වත්කම් කළමනාකරණය

### 3.2.1. නිශ්ක්‍රිය වත්කම්

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| බන්ධනාගාර 03 ක හා එළිමහන් වැඩ කඳවුරක පවතින බස්රථ 05 ක්, කාර් රථ 03 ක්, ට්‍රැක්ටරයක්, ගිනිනිවීමේ උපකරණ 04 ක් හා ආරක්ෂිත කැමරා පද්ධතියේ කැමරා 64 ක් අක්‍රියව පැවතුණි. | • බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනයට ගත නොහැකි වාහන අපහරණය කිරීම සඳහා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරනු ලබන බවත්<br>• විගණනය විසින් දක්වා ඇති ගිණි නිවීමේ උපකරණ 04 ක් නැවත භාවිතයට ගත නොහැකි බැවින් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරනු ලැබේ. | අක්‍රීයව වත්කම් සම්බන්ධයෙන් සුදුසු කටයුතු කළ යුතු වේ. |

### 3.2.2 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බන්ධනාගාර 03 ක හා එළිමහන් සිරකඳවුර හා තරුණ වරදකරුවන්ගේ මධ්‍යස්ථානයක වසර 01 ත් 10 ත් අතර කාලයක සිට බස් රථයක්, ලොරි රථ 03 ක්, බවුසරයක්, කාර් රථයක්, අත්ට්‍රැක්ටරයක්, යතුරුපැදියක්, ත්‍රීරෝද රථයක් හා ජෙනරේටරයක් ඌන උපයෝජිතව පැවතුණි. | ආරක්ෂණ සීමා කර ඇති බැවින් ධාවනයට අවශ්‍ය නොවීම, දෙපාර්තමේන්තුව නමින් පවරාගෙන නොමැති වීම, ඉන්ධන පාරිභෝජනය අධික වීම, බවුසරය ආයතනයේ ජලහිඟ අවස්ථාවලදී පමණක් භාවිතයට ගනු ලැබීම සහ ත්‍රීරෝද රථය අත්‍යාවශ්‍ය අවස්ථාවක පමණක් භාවිතයට ගැනීම යනාදි කරුණු මේ සඳහා හේතු වී තිබුණි. | ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් සුදුසු කටයුතු කළ යුතුය. |

### 3.2.3. තොග

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 මාර්තු 12 වන දින මහර බන්ධනාගාරයේ උපකරණ ගබඩාවේ සලාක ද්‍රව්‍ය අයිතම 07 ක් පිළිබඳ සිදුකරන නියැදි තොග භෞතික පරීක්ෂාවේ දී අයිතම 04 ක රු.4,158.78 ක ඌණතාවයක් ද, තොග අයිතම 03 ක රු.9,942.90 ක අතිරික්තයක් ද පැවතුණි. | අදහස් දක්වා නොමැත. | තොග සම්බන්ධයෙන් ඌනතා හා විශමතා කිසිවක් වෙතොත් මුදල් රෙගුලාසි 757(2) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) සලාක ද්‍රව්‍ය සැපයුම් සේවා ගිවිසුමට අනුව සුදු නාඩු සහල් කිලෝ ග්‍රෑම් 14,175 කින් කිලෝ ග්‍රෑම් 8,950 ක් ප්‍රමිතයෙන් තොරව සපයා ඇති බව නියැදි පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | -එම- | මුදල් රෙගුලාසි 128(1)(එ) ප්‍රකාරව රජයේ කටයුතු ඉටු කිරීමේ දී වියදම් කරනු ලබන මුදල රජයට උපරිම වටිනාකමක් ලැබෙන බවට සහතික වන පරිදි අරපිරිමැසේමන් යුතුව කටයුතු කල යුතු වේ. |

**3.3 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර 10 කට වැඩි කාලයක සිට පැවත එන හා වර්ෂ 1 ත් 10 ත් අතර කාලයකට අදාළ වන වාහන අනතුරු 228 ක් ඇතුලු අලාභ සිද්ධීන් 252 කට අදාලව රු.57,835,664 ක අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු විධිමත් පරිදි ඉටු කිරීම සඳහා වාහන අනතුරු කමිටුවක් මේ වන විට පත් කර ඇති අතර ඉදිරියේදී අලාභ අයකර ගැනීම හෝ කපා හැරීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව සිදු කිරීමට කටයුතු කරන බව විගණනය වෙත දන්වා සිටිමි | වාහන අනතුරු ඇතුලු අලාභ සම්බන්ධ මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. |

**3.4. විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන විමසුම පිළිබඳ විස්තර | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තු වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 05 ක් සඳහා 2021 ජුනි 30 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි. | දිවයින පුරා විසිරි ඇති බන්ධනාගාරවලින් පිළිතුරු කැඳවා පිළිතුරු ලබා දිය යුතු බැවින් ඇතැම් විගණන විමසුම් සඳහා නියමිත දිනට පිළිතුරු සැපයීමට නොහැකි වීම | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) වගන්තිය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලබන වෙනත් ඕනෑම නිලධාරියෙකු විසින් තමන් වෙත අමතනු ලබන ලිඛිත හා විමසීම් පිළිබඳ අප්‍රමාදව ක්‍රියාකොට ඒවාට සම්පූර්ණ පිළිතුරු සැපයීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. |

**4. යහපාලනය**

**4.1. අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **2018** අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය හා මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිට හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබිණි. | වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාදවූයෙන් එම වාර්තාවේ පිටපත් 2020 වර්ෂයේ දී ඉදිරිපත් කිරීමට නොහැකි විය. | විගණන පනත හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 5. විගණන හා විගණන කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/01-2019 දරන කළමනාකරන විගණන චක්‍රලේඛයේ 1.3 ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි. | මුල් කාර්තු 02 සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙක් සේවය නොකරන ලද අතර, වසංගත තත්ත්වය තුළදී රැස්වීම් පැවැත්වීම සීමාසහිත විය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට විධායක මට්ටමේ පුරප්පාඩු 84 ක්, තෘතිය මට්ටමේ පුරප්පාඩු 36 ක්, ද්විතිය මට්ටමේ පුරප්පාඩු 2,147 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 96 ක් ඇතුළුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 2,363 ක් විය. මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම බන්ධනාගාරවල සමස්ථ කාර්යසාධනයට අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු තත්ත්වයන් සම්බන්ධයෙන් විගණනය විසින් දක්වා ඇති නිරීක්ෂණ හා එකඟ වේ. නමුත් දැනට පවතින පුරප්පාඩු තත්ත්වය යටතේ වුවද හැකි උපරිම අයුරින් කාර්යක්ෂමතාවයෙන් ඉටු කිරීම සඳහා නිළධාරීන් කටයුතු කරනු ලබන බවත් ඉදිරියේදී මෙම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු සැලසුම් කර ඇති බවත් විගණනය වෙත දන්වා සිටිමි. | ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා කාලීන සමාලෝචනයක් කර ඒ අනුව කටයුතු කළ යුතු වේ. |